කාර්යාලය / அலுவலகம் / Office } 011-2186055

ලේකම් / செயலாளர் / Secretary: } 011-2186057

ෆැක්ස් / பெக்ஸ் / Fax: } 011-2187249

මගේ අංකය / எனது இல. / My No. } MWCA/06/11/62-1-2021

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2021.06. 02

කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය

மகளிர் மற்றும் சிறுவர் அபிவிருத்தி, முன்பள்ளி மற்றும் ஆரம்பக் கல்வி, அறநெறிப் பாடசாலைகள், கல்விச் சேவைகள் மற்றும் பாடசாலைகள் உட்கட்டமைப்பு வசதிகள் இராஜாங்க அமைச்சு

State Ministry of Women and Child Development, Pre-School & Primary Education, School Infrastructure & Education Services

ඊමේල්/மின் தபால் / Email: secretary@childwomenmin.gov.lk

වෙබ් අඩවිය/ ,izaj;jsk; / Website: www.childwomenmin.gov.lk

කාන්තා හා ළමා සංවර්ධන චක්‍රලේඛ - 02 /2021

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

**පෙර පාසල් ගුරුවරුන්ට රු.2500ක මාසික දීමනාවක් ලබාදීමේ වැඩසටහන - "ගුරු අභිමානී"**

පෙර පාසල් ගුරුවරුන්ගේ සේවය ඇගයීම හා ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය ඉහල නැංවීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක වන පෙර පාසල් ගුරුවරුන්ට මාසික දීමනාවක් ලබාදීමේ "ගුරු අභිමානී" වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පහත උපදෙස් කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

2. පෙර පාසල් ගුරුවරුන් වෙත ලබාදුන් රු.250/ක මාසික දීමනාව 2021-06-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රු.2500/ක් දක්වා ඉහළ නංවා ඇත. ඒ අනුව පෙර පාසල් ගුරුවරුන්ට මාසික දීමනාවක් ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාලව 2019-01- 16 දිනැතිව නිකුත් කරන ලද කාන්තා හා ළමා කටයුතු චක්‍රලේඛ 01/2019 අවලංගු කරන අතර " ගුරු අභිමානී " වැඩසටහන ඉදිරියට ක්‍රියාත්මක කිරීමට අදාල කාර්යයන් 02/2021 චක්‍රලේඛයට අනුකූලව සිදුකල යුතුය.

**3. වැඩසටහන ක්‍රියාත්මක කිරීම , වගකීම හා අධීක්ෂණය.**

3.1 මෙම වැඩසටහන තම කොට්ඨාසය තුල සාර්ථකව ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීමේ වගකීම ප්‍රාදේශීය ලේකම් වෙත පැවරීම සුදුසුය.

3.2 වැඩසටහන තම කොට්ඨාසය තුල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහය ලබාදීම, විෂය භාර අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සහ වැඩ සටහනට අදාල අනෙකුත් කාර්යයන් සිදු කිරීම මුල් ළමාවිය සංවර්ධන නිලධාරී වෙත පැවරේ. මුල් ළමාවිය සංවර්ධන නිලධාරී නොමැති අවස්ථාවලදී එම කටයුතු සිදු කිරීමට මෙම අමාත්‍යාංශය යටතේ අනුයුක්ත ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී , වනිතා සංවර්ධන නිලධාරී, උපදේශන සහකාර, වනිතා සංවර්ධන ක්ෂේත්‍ර සහකාර, ළමා රක්ෂණ නිලධාරී යන නිලධාරීන් අතුරින් ප්‍රාදේශීය ලේකම්ට සුදුසු යැයි හැගෙන නිලධාරියෙකුට පැවරීම උචිත වේ.

**4. ප්‍රතිලාභීන් තෝරාගැනීම.**

ප්‍රතිලාභීන් තෝරාගැනීම පහත සඳහන් නිර්ණායක වලට අනුකූලව සිදු කල යුතුය.

4.1. අදාල ගුරුවරියන්ගේ වයස අවුරුදු 18ට වැඩි විය යුතු අතර අවුරුදු 65 ට අඩුවිය යුතුය.

4.2 ගුරුවරියන්ගේ අවම අධ්‍යාපන සුදුසුකම් ලෙස අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ (සා/පෙළ) සමත් වී තිබීම

හා

මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය (ළමා ලේකම් කාර්යාලය) යටතේ ලියාපදිංචි ආයතනයකින් ලබාගත් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය / පෙර පාසල් පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම හෝ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් එක් අවුරුදු සහතික පත්‍ර පාඨමාලාව හෝ තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) මගින් ප්‍රතීතනය කරන ලද (Accreditation) පුහුණු ආයතනයකින් ලබාගත් (NVQ Level 4 හෝ ඊට වැඩි ) මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය / පෙර පාසල් පිළිබඳ ඩිප්ලෝමා /සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම අනිවාර්ය වේ.

ඉහත 4.2. හි මෙම වැඩසටහන සඳහා අ.පො.ස (සා/පෙළ) විභාගය සමත්වීම යන්න මව්බස හා ගණිතය ඇතුළුව විෂයන් 06ක් සමත්ව විෂයන් 03 කට සම්මාන සාමාර්ථ ලබා තිබීම යනුවෙන් අර්ථ දැක්වේ.

4.4 එසේ වුවද ඉහත අ.පො.ස (සා/පෙළ) විභාගය සමත් වීමේ සුදුසුකම සපුරා නොමැති ගුරුවරියන්ගේ අඛණ්ඩ සේවා කාලය අවුරුදු 5ක් වීම හා මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාව තිබීම යන සුදුසුකම් සපුරා ඇත්නම් මෙම ප්‍රතිලාභය ලබා දිය හැක.

4.5 ප්‍රතිලාභය ලබන ගුරුවරිය පූර්ණ කාලීනව පෙර පාසල් ගුරු වෘත්තියේ යෙදෙන අයෙකු විය යුතුය. එමෙන්ම ප්‍රතිලාභය ලබාදෙන වර්ෂයේ ජනවාරි 01 දිනට ගුරුවරියගේ අඛණ්ඩ සේවා කාලය වසරක් සම්පූර්ණ විය යුතුය.

4.5 ගුරුවරිය සේවය කරන පෙර පාසල අදාල පළාත් සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතු අතර එසේ නොමැති අවස්ථාවලදී අදාල පෙර පාසල වසර දෙකක කාලයක් ඇතුලත අදාල පළාත් සභාවේ විධිමත් ලෙස ලියාපදංචිය ලබාගැනීමේ කොන්දේසියට යටත්ව මෙම ප්‍රතිලාභය ලබාදිය හැකිය.

4.6 පෙර පාසල මඟින් දරුවකුගෙන් අයකර ගන්නා මාසික ගාස්තුව රු. 2,000/-ට වැඩි නොවිය යුතුය. එසේ වුවද රු.2,000/-ට වැඩියෙන් අය කරනු ලබන පෙර පාසලක් නම් එම පෙර පාසලේ හිමිකාරිත්වය දරණ ගුරුවරිය හැර අනෙකුත් ගුරුවරුන්ට මෙම දීමනාව හිමි වේ.

4.7 මෙම ප්‍රතිලාභය ලබන ගුරුවරිය වෙනත් කිසිදු රාජ්‍ය ආයතනයකින් හෝ පළාත් රාජ්‍ය ආයතනයකින් කිසිදු දීමනාවක් / වැටුපක් නොලබන හෝ රු. 2500/ට අඩු දීමනාවක් ලබන අයෙකු විය යුතුය. (දැනට ලබන දීමනාව රු.2500/- කට අඩු නම් එය රු.2500/ දක්වා වැඩි වීමට අවශ්‍ය හිඟ මුදල මෙම අවස්ථාවේදී ලබා දෙනු ලැබේ.)

4.8 ඉදිරියේදී මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් පවත්වනු ලබන අත්‍යාවශ්‍ය ගුරු පුහුණු වැඩසටහන් සඳහා උක්ත ප්‍රතිලාභය ලබන පෙර පාසල් ගුරුවරියන්ගේ අනිවාර්ය සහභාගිත්වය ලබාගැනීම සිදු විය යුතුය.

## 5 .වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය.

5.1 ඇමුණුම 01 අයදුම් පත්‍රය මඟින් පෙර පාසල් ගුරුවරියන්ගේ තොරතුරු ලබාගෙන මෙම චක්‍රලේඛයේ 4හි සඳහන් නිර්ණායක වලට අදාලව සුදුසුකම් ලබන ප්‍රතිලාභී පෙර පාසල් ගුරුවරුන්ගේ අයදුම්පත් සඳහා මුල් ළමාවිය සංවර්ධන නිළධාරිගේ නිර්දේශය සහ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාදිය යුතු වේ.

5.2 ඉන්පසු සුදුසුකම් සහිත ප්‍රතිලාභීන්ගේ තොරතුරු ප්‍රාදේශීය ලේකම් මඟින් දිස්ත්‍රික් ලේකම් වෙත (මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයට පිටපතක්ද සහිතව) යැවිය යුතු වේ.

5.3 දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරී විසින් තම දිස්ත්‍රික්කයට අදාලව සකස්කරන ලද ප්‍රතිලාභී ගුරුවරුන් සංඛ්‍යාව සහ මාසිකව අවශ්‍ය වන ප්‍රතිපාදන ප්‍රමාණය පිළිබඳ තොරතුරු දිස්ත්‍රික් ලේකම් මඟින් මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය වෙත එවිය යුතුය. එම ඉල්ලීම් අනුව අවශ්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් වෙත නිදහස් කරනු ලැබේ.

5.4 මුල් ළමාවිය සංවර්ධන නිලධාරී විසින් ප්‍රතිලාභී පෙර පාසල් ගුරුවරියන්ගේ තොරතුරු සෑම මසකම යාවත්කාලීන කොට, මුල් ළමා විය දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරී වෙත දැන්විය යුතුය. ඒ අනුව සෑම මසකම එක් එක් දිස්ත්‍රික්කයට අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය දිස්ත්‍රික් ලේකම් මඟින් ඉල්ලුම් කල යුතුය. මේ ආකාරයට වැඩසටහන ක්‍රියාත්මක කරගෙන යාමේදී අඛණ්ඩ සේවා කාලය එක් වසරක් සම්පූර්ණ වීම මත මෙම ප්‍රතිලාභය ලැබීමට නවක ගුරුවරුන් ඇතුලත් වන අතර වයස අවුරුදු 65 ඉක්මවීම මත ඇතැම්

ප්‍රතිලාභීන් මෙම දීමනාව ලැබීමට නුසුදුසු වන බැවින් එම ගුරුවරු පිළිබඳ තොරතුරු යාවත්කාලීන කිරීමේදී අවධානය යොමුකල යුතු වේ.

5.5 එක් මසකට රු. 2500/- බැගින් ප්‍රතිලාභය හිමි වන අතර එම දීමනාව පෙර පාසල් ගුරුවරියන්ගේ බැංකු ගිණුමට මාසිකව බැර කල යුතුය. මෙහිදී පළාත් සභාව මගින් රු. 2500/ට වඩා අඩු දීමනාවක් ලබන්නේ නම් හිඟ මුදල (රු. 2500 දක්වා වැඩි වීමට අවශ්‍ය) එම ගුරුවරුන්ට ලැබිය යුතුය

**6. දීමනාව අහිමි වීම**

6.1 ඉහත 4 හි සඳහන් නිර්ණායක කඩ කිරීම මත හෝ අසත්‍ය තොරතුරු හෝ ව්‍යාජ ලේඛන ඉදිරිපත් කිරීම මත වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම ප්‍රතිලාභය අහිමි වනු ඇත.

6.2 පහත 7.2 යටතේ ගුරුවරිය විසින් තමාගේ ගිණුමට මෙම මුදල ලැබුණු බවට අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණ අදාල ලේඛනයේ අත්සන් නොකිරීම මත නැවත ගුරුවරිය පැමිණ අත්සන් තබන තෙක් දීමනාව ලබාදීම තාවකාලිකව අත්හිටුවීමට යටත්වනු ලැබේ.

**7. ප්‍රගතිය වාර්තා කිරීම**

7.1 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ප්‍රගතිය එම කාර්යාල වල මුල් ළමාවිය සංවර්ධන නිලධාරී විසින් සකස් කර ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන සහිතව දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත යැවිය යුතු අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලැබෙන ප්‍රගතිය දිස්ත්‍රික් සම්බන්ධිකරණ නිලධාරී විසින් සකස් කර දිස්ත්‍රික් ලේකම්ගේ අත්සනින් මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය වෙත යොමු කල යුතුය.

7.2 තමාගේ ගිණුමට එම මුදල බැරවු බව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණ අදාල ලේඛනයේ අත්සන් කර ගුරුවරිය විසින් එය තහවුරු කල යුතුය.

ඉහත සඳහන් උපදෙස් අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටින අතර මෙම චක්‍රලේඛය මගින් ආවරණය නොවන වෙනත් කාරණාවක් පවතී නම් හෝ යම් ගුරුවරියකට මෙම ප්‍රතිලාභය නොලැබීම මත එම ගුරුවරිය විසින් ඉදිරිපත් කරන ලද අභියාචනා මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලට යොමුකරන මෙන් වැඩි දුරටත් සඳහන් කරමි.

ජේ.එම්.එස්.ඩී. ජයසේකර
ලේකම්

පිටපත් -

1. ජනාධිපති ලේකම් - ජනාධිපති ලේකම් කාර්යාලය
2. අග්‍රාමාත්‍ය ලේකම් - අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය
3. ලේකම් - මුදල් අමාත්‍යාංශය
4. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අය වැය දෙපාර්තමේතුව
4. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්
5. විගණකාධිපති - විගණකාධිපති දෙපාර්තමේන්තුව
6. ප්‍රධාන මූල්‍ය නිලධාරී - කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශ